**ශීර්ෂ 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශිර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.2.1 හා 3.2.2 වගුවල ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 03ක්ද සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 16 දින සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශීර්ෂ 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.5 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.1 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.3 |

**මුදල් රෙගුලාසි 128(2) - රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------------------------**

| | | | |
|---|---|---|---|
| 128(2)(අ) | ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරීම. | අපේක්ෂිත ආදායම රැස්කිරීමට නොහැකිවීම/ රැස්කළ හැකි ආදායම වැඩිවීමකදී හෝ අඩු වීමකදී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට පියවර නොගැනීම. | 2.2(ඇ) (ii) |
| 128(2)(ආ) | මුදල් වර්ෂය අවසානයේදී මුදල් රෙගුලාසි 151 ප්‍රකාරව ආදායම් ගිණුම් පිළියෙල කිරීම. | ආදායම් ගිණුම විගණනයට ඉදිරිපත් නොකිරීම/ ප්‍රමාද වී ඉදිරිපත් කිරීම/ විධිමත් පරිදි පිළියෙල කර නොතිබීම. | 2.2(අ)( ii) |
| 128(2)(ඇ) | ආදායම් සංකේතයට අදාළව මුදල් වර්ෂයේ ජුනි 30 දිනට හා දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් තත්ත්වය පෙන්නුම් කරන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.<br>(මෙම වාර්තාව පිළිවෙලින් ජුලි 31 දින හා ජනවාරි 31 දිනට කලින් විගණකාධිපති වෙත ලැබිය යුතුය. පිටපතක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.) | අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා නියමිත දිනයට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2.2(අ)(i) |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.2 (අ),(ආ)(ඇ)( i)(iii) |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව. | ආදායම් සංකේතයට අදාළව ආදායම් රැස්කර ආයතනවලින් හිඟ හිටි ආදායම් පිළිබඳ තොරතුරු කැඳවා නොතිබුණි/ තොරතුරු කැඳවා තිබුණත්, එම ආයතන විසින් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2.2 (අ)(iv)(vii) |

**2 ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 28.55 | 26.35 | 2.20 | 7.71 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **28.55** | **26.35** | **2.20** | **7.71** |
| 2014 | පුනරාවර්තන | 30.30 | 27.60 | 2.70 | 8.91 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **30.30** | **27.60** | **2.70** | **8.91** |
| 2015 | පුනරාවර්තන | 49.20 | 47.44 | 1.76 | 3.58 |
| | මූලධන | - | - | - | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **එකතුව** | **49.20** | **47.44** | **1.76** | **3.58** |
| 2016 | පුනරාවර්තන | 49.82 | 47.94 | 1.88 | 3.77 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **49.82** | **47.94** | **1.88** | **3.77** |
| 2017 | පුනරාවර්තන | 53.06 | 52.95 | 0.11 | 0.21 |
| | මූලධන | - | - | - | - |
| | **එකතුව** | **53.06** | **52.95** | **0.11** | **0.21** |

## 2.2 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 03 ක් සඳහා එකතුව රු.මිලියන 150 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 232.96 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 155.31 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **ආදායම් සංකේතය** | **2017 දෙසැම්බර් 31 දිනට** | | | **රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ අදායමේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම/ (ඌනතාවය)** | |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| (1) | 20.03.02.10 | 100.00 | 200.90 | 100.90 | 200.90 |
| (2) | 20.03.02.12 | 25.00 | 31.17 | 6.17 | 124.70 |
| (3) | 10.03.07.08 | 25.00 | 0.89 | (24.11) | 3.56 |
| | එකතුව | **150.00** | **232.96** | **82.96** | |

ඉහත සඳහන් ආදායම් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 20.03.02.10 දරන ආදායම් සංකේතය - සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු**

------------------------------------------------------------------------

(i) මුදල් රෙගුලාසි 128 (2) (ඇ) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාළ හිඟ ආදායම් සම්බන්ධ අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව හිඟ හිට තිබුණු වාර්ෂික වාර්තා ආදායම් කිසිවක් දක්වා නොතිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව 2017 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ අරමුදලට හිඟ හිට තිබුණු ආදායම රු.මිලියන 541.21 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමිති 12,380 කින් වාර්ෂික වාර්තා ගොනුකර තිබූ සමිති සංඛ්‍යාව 204 ක් පමණි, එබැවින් රැස් කර තිබූ ආදායම රු.මිලියන 0.20 ක් හෙවත් රැස් කර ගත යුතු ආදායමෙන් සියයට 1.62 ක් පමණක් විය. ඒ අනුව 2017 වර්ෂයට පමණක් හිඟ ආදායම රු.මිලියන 12.17 ක් විය. ක්‍රියාකාරී සමිති හඳුනාගෙන සමිතිවලින් වාර්ෂික වාර්තා වෙනුවෙන් ලැබිය යුතු ආදායම, ආදායම් ගිණුමේ ලැබිය යුතු ආදායමක් ලෙස දැක්වීමට සහ ලැබිය යුතු ආදායම රැස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) සමාගම් පනතේ 170 (1) වගන්තියට අනුව මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 7,468 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ සමාගම් සංඛ්‍යාව 2,215 ක් වූයෙන් ලබාගෙන තිබූ මුළු ආදායම රු.මිලියන 4.43 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය වාර්තා සඳහා අයකර නොගත් හිඟ ආදායම රු.මිලියන 10.51 ක් විය. නමුත්, සමාගම් පනතේ ඉහත වගන්තිය ප්‍රකාර මූල්‍ය වාර්තා ලියාපදිංචි නොකළ සමාගම් හඳුනාගෙන ඒවායේ මූල්‍ය වාර්තා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවීමට අදාල ක්‍රමවේදයක් සකස් කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(v) දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිගණක පද්ධතියක් ස්ථාපිත කරගැනීමට මේ දක්වා අපොහොසත් වීම හේතුවෙන් සත්‍ය වශයෙන් ක්‍රියාකාරී සමාගම් සංඛ්‍යාව හා ක්‍රියාකාරී නොවන සමාගම් සංඛ්‍යාව, වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු සමාගම් සංඛ්‍යාව හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ සමාගම් සංඛ්‍යාව සහ ක්‍රියාකාරී ලියාපදිංචි සමිති සංඛ්‍යාව හා ක්‍රියාකාරී නොවන සමිති සංඛ්‍යාව පිළිබඳව නිවැරදි සංඛ්‍යා දත්ත ලබාගැනීම, රැස්කර ගත හැකි ආදායම් හා හිඟ ආදායම් නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ) 10.03.07.08 දරන ආදායම් සංකේතය - සමාගම් ලියාපදිංචි කිරීමේ බදු**

------------------------------------------------------------------------

නීතිමය විධිවිධාන සළසා ගැනීමක් නොමැතිව වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් (Levy) අය කර ඇති බව නිරීක්ෂණය වන අතර, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගම් 15 කින් පමණක් සමාලෝචිත වර්ෂයේදී මෙම බලපත්‍ර ගාස්තුව අය කර තිබුණි. මෙම තත්ත්වය යටතේ ඉකුත් වර්ෂයේදී බලපත්‍ර ගාස්තුව අයකර ඇති සමාගම් 25ක් පමණ එම මුදල ආපසු ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**(ඇ) 20.03.02.12 දරන ආදායම් සංකේතය - පොදු කොන්ත්‍රාත් පනත යටතේ අය කරනු ලබන ගාස්තු**

**පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව රු. මිලියන 05 ක් ඉක්මවන සියළු පොදු කොන්ත්‍රාත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු අතර, අංක 508/7 හා 1988 ජුනි 02 දිනැති ගැසට් නිවේදනයට අනුව සියළු පොදු කොන්ත්‍රාත් ගිවිසුම් කොන්ත්‍රාත් ප්‍රදානයෙන් දින 60 ක් ඇතුළත ලියාපදිංචි කළ යුතුය. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රමාණාත්මක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවන අතර පනතේ 6 (1) වගන්තියේ (අ) ඡේදය ප්‍රකාර විධිමත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. නියැදි විගණන පරීක්ෂණයකට අනුව ලියාපදිංචි පොදු කොන්ත්‍රාත් 2176 කට අදාලව ගිවිසුම් ලියාපදිංචි කර තිබුණේ 97 ක් පමණි.

(ii) මුදල් රෙගුලාසි 128 2(අ) වගන්තිය මෙන්ම 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ චක්‍රලේඛයේ 03 ඡේදය පරිදි ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත් හැකිතාක් නිවැරදිවත් සකස් කිරීම ආදායම් ගණන්දීමේ නිලධාරීන්ගේ ප්‍රධාන කාර්යය වුවත්, ආදායම් ශීර්ෂය සඳහා සත්‍ය ආදායම ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 124.70 ක් විය.

(iii) පනතේ 11(3) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ සහතිකය දෙන ලද අවස්ථාවේ සිට, වර්ෂයක කාලයක් සඳහා බලාත්මකව පවතින අතර කොන්ත්‍රාතුව වර්ෂය ඉක්ම වන්නේ නම් නියමිත ගාස්තුව ගෙවා වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කල යුතු වේ. එහෙත් වර්ෂයක කාලය ඉකුත්වන කොන්ත්‍රාත් සඳහා නැවත ලියාපදිංචිය අළුත් කිරීම සඳහා කටයුතු සිදුවන්නේද යන්න අධීක්ෂණය කිරීමක් සිදුකර නොතිබුණි.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට අදාල විෂයය අංක 29701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.50 | 6.49 | 3.00 | 4.11 | 20.00 | 2.38 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

**-------------------------------------------**

විශ්‍රාම යන නිලධාරීන්ගෙන් අයවිය යුතු අවකරණ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීම සඳහා ක්‍රමවේදයන් 2016 ජනවාරි 12 දිනැති හා අංක 01/2016 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් දෙදෙනෙකුගේ රු.මිලියන 0.51 ක ණයශේෂ පියවා ගැනීම සඳහා මාස 03ක සිට 04ක් දක්වා  කාලයක් ගත වී තිබුණි. තවද වැඩතහනමට ලක් වූ නිලධාරියෙකුගෙන් වසර 05 ඉක්මවූ රු.මිලියන 0.017ක ණයශේෂයක් නිරවුල් කර නොතිබුණි.

## 2.4 අභ්‍යන්තර විගණනය

**------------------------**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඇති අතර අභ්‍යන්තර විගණක ඇතුළු තවත් නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුනද, 2009 ජූනි 09 දිනැති හා අංක ඩීඑම්ඒ/2009 (1) කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 (2) ප්‍රකාරව  අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙම අංශය විසින් නිකුත් කොට තිබූ විගණන විමසුම් සංඛ්‍යාව තුනක් පමණක් විය.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

**-------------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය  හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**-----------------------------------------------------------------------------------------------**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 52.71 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 10 | 05 |
| (ii) | තෘතීය මට්ටම | 04 | 01 | 03 |
| (iii) | ද්විතීය මට්ටම | 107 | 76 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 29 | - |
| | **එකතුව** | **155** | **116** | **39** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i)දෙපාර්තමේන්තුවේ ප්‍රධානම විධායක තනතුර වන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවා සුදුසුකම් ලත් නිලධාරියෙකු තෝරා ගත නොහැකි වූ බැවින් 2013 ජනවාරි 25 දිනැති අංක 12/1784/515/032 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සමාගම් රෙජිස්ට්‍රාර් III තනතුරෙහි වැඩිම කාලයක් සේවයේ නියුක්ත නිලධාරියා රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර, වැඩබලන තනතුරේ ආරම්භක වැටුපෙන් 1/6 ක දීමනාවක්ද ගෙවා තිබුණි.ඉන්පසු 2014 පෙබරවාරි 24 දින සමාගම් රෙජිස්ට්‍රාර් II ශ්‍රේණියට උසස්වීම් ලැබූ මෙම නිලධාරියා රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ පූර්ණකාලීන වැඩ බැලීමේ පදනම මත 2016 ජනවාරි 01 දින සිට පත්කොට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.5.3 ඡේද ප්‍රකාරව වැඩ බැලීමේ තනතුරේ ආරම්භක වැටුප් පියවරේ තැබීමට කටයුතු කර තිබුණි.

(ii) සමාගම් රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියේ අනුමත තනතුරු දෙක පුරප්පාඩුව සඳහා II ශ්‍රේණියේ නිලධාරිනියන් දෙදෙනෙකු රාජකාරි ඉටුකිරීමේ පදනමින් පත්කර 2015 ජූලි මාසයේ සිට රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට හිමි වැටුපෙන් 1/6 බැගින් දීමනා ගෙවා තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාලව නීති නිලධාරි තනතුර, සහකාර/නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) යන තනතුරු දෙක හා ද්විතීක මට්ටමේ සමාගම් පරීක්ෂක නිලධාරී තනතුරු 10ක් ද , පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබයි.

(ඇ) වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් වන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 11ක් , කාර්යාල කාර්ය සහයක සේවයේ නිලධාරීන් 05 ක් හා රියදුරු සේවයේ නිලධාරියෙකු වර්ෂ 06ක සිට වර්ෂ 17ක් දක්වා කාලයක් ස්ථාන මාරුවීම් නොලබා සේවය කරනු ලබයි.